# සිංහල

## කියවීම් පොත

## 1 වන ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පළමුවන මුද්‍රණය 2015

සියලු හිමිකම් ඇවිරිණි.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
හෝමාගම, කටුවාන පාර, කාර්මික ජනපදයේ අංක 67 හි පිහිටි
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගමෙහි මුද්‍රණය කරවා
ප්‍රකාශයට පත් කරන ලදි.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

සුන්දර ළමා විය වඩාත් අර්ථවත් වන්නේ අධ්‍යාපනය තුළිනි. ළමා මනසට වඩාත් ගැළපෙන ලෙස සකස් කෙරුණු මෙම පෙළපොත ඔබ වෙත නොමිලේ තිළිණ කරනු ලබන්නේ සාර්ථක අධ්‍යාපනයක් තුළින් යහපත් අනාගතයක් උදාකර දෙන අරමුණෙනි.

**අකිල විරාජ් කාරියවසම්,**
අධ්‍යාපන අමාත්‍ය

## පෙරවදන

නැණ ගුණ පිරුණු දරු පරපුරක් මගින් යහපත් අනාගත පුරවැසියන් බිහි කිරීම අධ්‍යාපනයේ කාර්යයයි. ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධානතම අරමුණ වන්නේ ඒ සඳහා අවශ්‍ය මූලික අඩිතාලම දැමීමයි. ඔබේ දැනුම මෙන් ම හසුරු කුසලතා ද සංවර්ධනය වන ලෙස මෙම පෙළපොත් සැකසී තිබේ.

2016 වර්ෂයේ දී පළමු වැනි ශ්‍රේණියෙන් ආරම්භ වී අලුත් විෂය මාලාවක් හා ඊට ගැළපෙන නව පෙළපොත ද හඳුන්වා දීමට අප පියවර ගෙන ඇත.

මෙය හොඳින් කියවා, ක්‍රියාකාරකම්වල යෙදී, දැනුම ලබා, ඔබ රටට වැඩදායී පුරවැසියකු වනු දැක්ම අපගේ අරමුණයි.

මෙම පෙළපොත සම්පාදනයට දායක වූ ලේඛක මණ්ඩලයටත්, සංස්කාරක මණ්ඩලයටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මගේ ස්තුතිය හිමි වේ.

**තිස්ස හේවාවිතාන,**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2015.05.14

**නියාමනය හා අධීක්ෂණය**

| | | |
|---|---|---|
| තිස්ස හේවාවිතාන මයා | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**මෙහෙයවීම හා සම්බන්ධීකරණය**

| | | |
|---|---|---|
| ඩබ්ලිව්.ඩී. පද්මිණී නාලිකා මිය | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**ලේඛක හා සංස්කාරක මණ්ඩලය**

| | | |
|---|---|---|
| එම්.අර්.ඩබ්ලිව්. මද්දුම මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය,<br>මහරගම. |
| ඩබ්ලිව්. කරුණාරත්න මයා | - | කථිකාචාර්ය,<br>ගුරු මධ්‍යස්ථානය,<br>ගිරාගම. |
| රෝහිණී චිත්‍රලතා මිය | - | ප්‍රාථමික ගුරු උපදේශක,<br>ගිරිඋල්ල අධ්‍යාපන කලාපය,<br>වයඹ පළාත. |
| එම්. චන්ද්‍රමාලි වික්‍රමසේකර මිය | - | පීඨාධිපති,<br>ඌව විද්‍යාපීඨය,<br>බණ්ඩාරවෙල. |
| අයි.අයි. රණසූරිය මිය | - | ප්‍රාථමික කථිකාචාර්ය (විශ්‍රාමික),<br>ඌව විද්‍යාපීඨය,<br>බණ්ඩාරවෙල. |

| | | |
|---|---|---|
| නයන තිලක් රත්නායක මයා | - | විශ්‍රාමලත් සිංහල විෂය අධ්‍යක්ෂ. |
| ආර්.එස්.නන්දා විජේසිංහ මිය | - | ගුරු සේවය,<br>වාගිරි රතනාලංකාර මහා විද්‍යාලය,<br>අබ්බෝව,<br>අලව්ව. |
| ජේ.එම්.එන්. ජයසුන්දර මිය | - | ගුරු සේවය,<br>පොරමඬල ප්‍රාථමික විද්‍යාලය.<br>යටිගල්ඔලුව. |
| ඩබ්ලිව්.එම්. ඒ වික්‍රමාරච්චි මිය | - | ගුරු සේවය,<br>කබුලුමුල්ල ළමා මිතුරු ආදර්ශ විද්‍යාලය.<br>රුවන්වැල්ල. |

**චිත්‍ර නිර්මාණය හා පිටකවර නිර්මාණය**

| | | |
|---|---|---|
| කේ.ඒ. සමන් කලුබෝවිල මයා | - | චිත්‍ර කලා ආචාර්ය,<br>ගම්/ අනුර මධ්‍ය මහා විද්‍යාලය,<br>යක්කල. |

**පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැකසුම**


| | | |
|---|---|---|
| හසල චතුරංග විතානගේ මයා | - | පරිගණක අංශය,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

# පටුන



| | | පිටු අංකය |
|---|---|---|
| | පින්තූර බලන්න. එහි ඇති දේ කියන්න. | 1 - 2 - 3 |
| 1. | ලස්සන මල් | 5 |
| 2. | ටිං ටිං ලේනා | 10 |
| 3. | පාසල් යනවා | 13 |
| 4. | සෙල්ලම් කරමු | 16 |
| 5. | අවුරුදු ආවා | 18 |
| 6. | කිරි සුදු හාවා | 22 |
| 7. | යාළු මාළු | 24 |
| 8. | සිඟිති පොළ | 26 |
| 9. | පුංචි මකුළුවා | 29 |
| 10. | සත්තු වත්ත | 32 |
| 11. | පුහුල් හොරා කරෙන් දැනේ | 35 |
| 12. | හිමිදිරි උදය | 37 |




පින්තූර බලා කතාව කියන්න.



පින්තූර බලා කතාව කියන්න.











# පින්තූර බලා කතාව කියන්න.











# 1. ලස්සන මල්

මල



මල් ගස








අර බලන්න
ලස්සන මලක්



උඩ අත්තක
අන්න මලක්
ඒ මල හරිම
ලස්සනයි.



අර බලන්න මල්
පාට පාට මල්


සහන් පවනි
මල් ගස් යට ඉන්නවා.



අර බලන්න මල්
හරි ලස්සන මල්



## 2. ටිං ටිං ලේනා



ටිං ටිං ටිං
ලේන් පැටියාට
හොඳට ම බඩගිනියි.
ලේන් අම්මාට දුකයි.

ජම්බු ගහේ උස අත්තක
ජම්බු පොකුරක් දැක්කා.
රතු ම රතුයි.
හොඳට ම ඉදිලා.

ලේන් අම්මා
ජම්බු ගෙඩියක් කැඩුවා.
ලේන් පැටියාට දුන්නා.



පුංචි මලී ජම්බු කන්න
හරි ආසයි.
අම්මේ
මට ජම්බු ගෙඩියක්
කඩලා දෙන්න.
ජම්බු තියෙන්නේ
උස අතුවලනේ.



මේ කතාව ලේන් අම්මාට ඇහුණා.
ලේන් අම්මා
ජම්බු ගෙඩියක් කැඩුවා.
ජම්බු ගෙඩිය බිමට දැම්මා.






මලී ජම්බුගෙඩිය අහුලා ගත්තා.
උඩ බැලුවා.
ලේන් අම්මා
මලී දිහා බලා සිටියා.



මලීට හරි සතුටුයි.
මලී ලේන් අම්මාට
ස්තුති කළා.

# 3. පාසල් යනවා




උදෑසන ම අවදි වෙලා
දත කට මුව සෝදාලා
දෙමාපියන් පා වැඳලා
පාසල් යනවා

රූප කපා කොළ අලවා
නැටුම් නටා ගී ගයලා
මල් අමුණා වැල් ගොතලා
සතුටින් එනවා



සෙල්ලම් ගෙදරක් හදලා
පුංචි අතින් බත් උයලා
ගෙදර ඉන්න හැම දෙනාට
කෑම බෙදනවා




# 4. සෙල්ලම් කරමු

තාරක ආවා
ජානක ආවා
කුමාර එක්ක ම
කෝසල ආවා

එල්ලේ ගහමු ද
ඔන්චිලි පදිමු ද
බට්ටා පනිමු ද
ජානක ඇහුවා

බට්ටා පනිමු
බට්ටා පනිමු
හැමෝ ම සතුටින්
එකවර කිවුවා






කෝටුව ගත්තා
කොටුවක් ඇන්දා
අඹ කොට්ටය ගෙන
බට්ටා පැන්නා

ජානක පැන්නා
කුමාර පැන්නා
කෝසල කොටුවේ
මැදට ම පැන්නා

කොටුවෙන් කොටුවට
පැනගිය තාරක
අන්තිම කොටුවට
සතුටින් පැන්නා

# 5. අවුරුදු ආවා



චට පට චට පට
අවුරුදු අවුරුදු
අද අපට අවුරුදු
සහන් කිවුවා.

අලුත් අලුත් ඇඳුම්
රස රස කැවිලි
අපට හරි සතුටුයි.
පවනි කිවුවා.

පුතා එන්න.
දුවත් එන්න.
නැකත් වෙලාව ළඟයි.

අම්මයි තාත්තයි
අපට කිරිබත් කැවුවා.

එන්න නංගි
අපි අම්මාටයි තාත්තාටයි
බුලත් දී වඳිමු.




අයියේ අන්න රාමලා එනවා.

එන්න දුව එන්න පුතා
අවුරුදු සරුයි වගේ
තාත්තා හැමෝට ම
ආයුබෝවන් කිවුවා.

අපි තේ බොමු.
කැවුම් කොකිස් කිරිබත් තියෙනවා.
අම්මා කිවුවා.

මම මුංකැවුම් කන්න කැමතියි.
රාමා කිවුවා.
මේ කැවිලි හරි රසයි.



අපි රබන් ගහමු.
පවනි රබන් පද කිවුවා.

එගොඩ ගොඩෙත් රත්තරං
මෙගොඩ ගොඩෙත් රත්තරං
එගොඩ ගොඩෙත් මෙගොඩ ගොඩෙත්
ඇතෙක් බරට රත්තරං

හැමෝ ම තාලෙට රබන් ගැසුවා.



# 6. කිරි සුදු හාවා




පුළුන් වගේ සුදු හාවා
කන් දෙක ඔසවා බැලුවා
පඳුරු උඩින් පැන ආවා
උඳුපියලිය කොළ කෑවා



පැන පැන ආ සුදු හාවා
ආයෙත් වටපිට බැලුවා
වත්ත පහළ වෙල ගාවා
සතුටින් පිනුමක් ගැහුවා

සීතල සුළඟක් හැමුවා
ගස්වල දලු කොළ නැටුවා
කුරුලු පැටව් ගී ගැයුවා
තාලෙට අත්තටු සැලුවා



# 7. යාළු මාළු




අද නිවාඩු දවසක්
මනුක මිදුලට බැස්සා.
ඇළ ළඟට ගියා.
වතුරත් අඩුයි.

ඇළේ වතුර
හරි පැහැදිලියි.
මාළු හොඳට පේනවා.
බලා ගෙන ඉන්න ආසයි.

මෙන්න පුංචි මාළුවෙක්
පුංචි මාළුවා හරිම සතුටින්
එහාට පීනනවා
මෙහාට පීනනවා.

උඩට එනවා
යටට යනවා.
වතුර බුබුළු හදනවා මනුක දැක්කා.



පුංචි මාළුවා ආයෙමත්
එහාට පීනනවා
මෙහාට පීනනවා.

උඩට එනවා
යටට යනවා.
වතුර බුබුළු හදනවා.

පුංචි මාළුවෝ
මටත් ආසයි පීනන්න.
ඔයාගෙ වරල් මට දෙන්න
මනුක කිවුවා.

පුංචි මාළුවා වතුර යටට පීනා ගියා.
අම්මගෙන් අහන්න වෙන්න ඇති
මනුක සිතුවා.

# 8. සිඟිති පොළ

අපි හෙට පොළක් දමමු
ගුරුතුමී කිවුවා.
හැමෝ ම පොළට
බඩු ගේන්න.
බඩු විකුණන්නේ ළමයි.
දෙමව්පියන්ටත්
එන්න කියන්න.





ළමයි පොළට බඩු ගෙනාවා.

රාබු කැරට් බටු පතෝල පොළේ තිබුණා.

පවනි බණ්ඩක්කා විකුණුවා.

කසුන් මෑකරල් විකුණුවා.

ළමයි හැමෝ ම මුදලාලිලා වුණා.

බඩු ගන්න අම්මලා ආවා
තාත්තලාත් ආවා.
හැමෝ ම බඩු මිල දී ගත්තා.





# 9. පුංචි මකුළුවා

පුංචි මකුළු යාළුවේ
තනියම ඇයි පාළුවේ

දැල වියන්න යාළුවේ
තැනක් සොයමි පාඩුවේ

පේරගසේ උඩ අත්තේ
හොඳ ම තැනක් එහි ඇත්තේ

පේර ගසේ දැල ගොතලා
වැස්සට යයිදෝ කැඩිලා

අපේ ගෙදර ගෙයි මුල්ලක
දැල වියන්න එන්න හණික





හොඳයි ඉතින් දැල වියන්න
පුංචි ඔයත් බලන් ඉන්න

ඔය ලස්සන දැල වියන්න
අනේ මටත් කියා දෙන්න



වට රවුමට දැල වියන්න
අම්මයි මට කියල දුන්නේ



තද සුළඟක් එන්න එපා
දැල අරගෙන යන්න එපා
මේ ලස්සන මකුළු දැලට
කරදරයක් වෙන්න එපා

# 10. සත්තු වත්ත

පුතාලා ඊයේ කොහේ ද ගියේ?

සීයේ අපි සත්තු වත්තට ගියා.

සත්තු වත්තේ ගොඩක් සත්තු හිටියා ද?

ඔව් සීයේ මින් මැදුර හරි ලස්සනයි.

පාට පාට මාළුවෝ පීන පීන හිටියා.



පුතාලා අලි නැටුම් බැලුවේ නැද්ද?

බැලුවා හරි ම ලස්සනයි සීයේ.

නංගි අලි පේළිය දැක්කා ද?

ඔව් අයියේ


අලි පැටියෙක් බිම වාඩි වුණා.

පිනුම් ගැහුවා.


උඩ පැන පැන නැටුවා.

අපි හයියෙන් අත්පොඩි ගැහුවා.

අපිට හරි සතුටුයි.



පුංචි පුංචි මල් වගේ
ළමා ළපටි හරි අගේ
ඇවිදීමෙන් රට වටේ
දැන ගත හැක බොහොම දේ



# 11. පුහුල් හොරා කරෙන් දැනේ

ගමරාලගේ එළවළු කොටුවේ පුහුල් වැලක් තිබුණා.


ඒ වැලේ ලොකු පුහුල් ගෙඩියක් තිබුණා.


දවසක් ගමරාල ඒක කඩා ගන්න කොටුවට ගියා.

පුහුල් ගෙඩිය තිබුණේ නෑ

පුහුල් ගෙඩියට මොක ද වුණේ?

ගමරාල කල්පනා කළා.





ගමරාල ගෙදර ගියා සීනුවක් නාද කරන්න
පටන් ගත්තා.


මිනිස්සු ගමරාල වටේ එකතු වුණා.

මගේ කොටුවේ තිබුණු පුහුල් ගෙඩිය නෑ
පුහුල් හොරා කරෙන් දැනේ
පුහුල් හොරා කරෙන් දැනේ ගමරාල කිවුවා.

ගමරාල එහෙම කියනකොට
එක් කෙනෙක් තමන්ගේ කර පිස දැම්මා.


ගමරාල ඒක දැක්කා.

# 12. හිමිදිරි උදය



කන්ද උඩින් ඉර පායා
රැස් විහිදෙනවා
පාට පාට මල් පිපිලා
සුවඳ හමනවා

රංචු රංචු සමනලයින්
මල් පැණි බොනවා
වසු පැටියා දුව පනිමින්
අම්මා සොයනවා



ලියදි පුරා ළපටි ගොයම
සුළඟෙ වැනෙනවා
දොළ පාරේ සීත ජලය
උතුරා යනවා

කුරුලු රංචු කීචි බීචි
සින්දු කියනවා
පුංචි ළමයි හරි සතුටින්
පාසල් යනවා

අ ආ ඇ ඈ

ඉ ඊ උ ඌ

එ ඒ ඔ ඕ

ක ග

ච ජ

ට ඩ ණ

ත ද න

ප බ ම

ය ර ල ව

ස හ ළ

(අ)ං

ඟ ඬ ඳ ඹ

ෆ

## ගුරු උපදෙස්

ප්‍රාථමික පාසල් අවධිය යනු ශිෂ්‍යයාගේ ශාරීරික, මානසික, චිත්තවේගීය හා චාලක යන ශක්ති සංවර්ධනය වන ඉතා ම තීරණාත්මක කාල පරිච්ඡේදයකි. භාෂා දක්ෂතා සිසුන්ට ලබා දීමේදී ගුරුවරයා හා ශිෂ්‍යයා අතර අන්‍යෝන්‍ය වශයෙන් ඉතා සමීප බලපෑම් ඇති කරවන ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීම ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දී ඉතා වැදගත් වේ.

සිංහල කියවීම් පොත ගොඩනගා ඇත්තේ සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම යන නිපුණතා වර්ධනය කරවීමේ අරමුණු ඇතිව ය. ප්‍රාථමික අධ්‍යාපනයේ දී ජීවිතයේ මූලික අත්දැකීම් ලබන ශිෂ්‍යයා සරල ලෙස කියවීම හුරුවීමේ මූලික දක්ෂතාව සඳහා සූදානම් වේ. කියවීමේ දී ඇස්, මාංසපේශි හා චිත්ත වේග එකතු වී ක්‍රියා කරයි. සිංහල කියවීම් පොතේ පාඩම් මගින් බලාපොරොත්තු වන්නේ එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දීමටත්, කථා කිරීමටත්, නිවැරදි උච්චාරණය සහිත ව මූලික හැඩ ගැසීම් ඇති කිරීමටත් කවි, ගී, කතන්දර කියවා රස විඳීමටත් ශිෂ්‍යයාට අවස්ථා ඇති කිරීමට ය.

"ලස්සන මල්" පාඩමෙන් සොබා දහමේ අසිරිය විඳ ගනිමින් කියවීමට හුරු කිරීමට බලාපොරොත්තු වේ. එකමුතුකම, සාමය, සමගිය, ත්‍යාගශීලී බව, බෙදා හදා ගැනීම වර්ධනය කිරීමත්, වින්දනය ලබා දීමටත් "ටිං ටිං ලේනා"පාඩමෙන් අපේක්ෂිත ය. ළමයින් වඩාත් කැමති සතුන්ගේ ගති ස්වභාව හා පරිසරයේ ඇස ගැටෙන දේ කෙරෙහි අවධානයෙන් බැලීමට යොමු කිරීම "කිරි සුදු හාවා" පාඩමෙන් අවධාරණය කෙරේ. ළමයින් වඩාත් ප්‍රිය කරන සාමූහික ක්‍රීඩාවක් ඇසුරෙන් "සෙල්ලම් කරමු" පාඩම ඉදිරිපත් කර ඇත. වින්දනය ලබන අතර ම ගණිත සංකල්පවලට ප්‍රවේශයක් ලබා ගැනීමට ශිෂ්‍යයා යොමු කිරීම මෙමගින් බලාපොරොත්තු වේ.

"අවුරුදු ආවා" පාඩමෙන් ජාතික සමගිය ගොඩ නැංවීම පිළිබඳ ව දරුවන්ගේ සිත් තුළ අවබෝධය ජනිත කරවීම අරමුණු කෙරේ. "යාළු මාළු" පාඩමෙන් බලාපොරොත්තු වන්නේ දරුවන් නිරීක්ෂණයට යොමු කරවීමටත්,සංවාද ගොඩ නැංවීමටත් පිටිවහලක් ලබා දීම ය. ළමයින් සියලු දෙනා එක් වී යෙදෙන සාමූහික ක්‍රියාකාරකමක් ලෙස "සිඟිති පොළ" පාඩම හඳුන්වා දිය හැකි ය.

මෙම ක්‍රියාකාරකම සිඟිති කාමරයේ, සෙල්ලම් මිදුලේ හෝ පාසල් වත්තේ කළ හැකි ය. මෙමගින් වාග් මාලාව පෝෂණය කිරීම සඳහා එකමුතුකම, සමගිය, බෙදා හාදා ගැනීම, ආචාරශීලී කථා බහ වැනි හොඳ ගුණාංග ළමයා තුළ ඇති කරවීම බලාපොරොත්තු වේ.

සංවිධානාත්මක ස්වරූපයෙන් සකස් කර ඇති "පුංචි මකුළුවා" පාඩම මගින් සතුන්ට ආදරය කිරීමත්, රිද්මයට අනුව ගායනයට යොමු කිරීමත් බලාපොරොත්තු වේ. ජනකථාවක් ඇසුරින් නිර්මිත "පුහුල් හොරා කරෙන් දනේ" පාඩම මගින් අයහපත් ක්‍රියාකාරකම්වල යෙදීමේ නුසුදුසු බව සහ අන්සතු දේ නොගැනීමට ළමා සිත නැඹුරු කිරීම අපේක්ෂා කෙරේ.

හිමිදිරි උදය පාඩම මගින් බලාපොරොත්තු වන්නේ සොබා දහමේ ඇති සුන්දර වස්තු ඇසුරෙන් කියවීමට හුරු කරවීමයි.

සිංහල වැඩපොත සකස් කර ඇත්තේ නිවැරදි ව ලිවීමේ මූලික දක්ෂතා සඳහා මූලික හුරුව ලබා දීමට ය. රූපවල ඇති සියුම් වෙනස්කම් දැකීමට, අකුරු හා රූප අතර වෙනස හඳුනා ගැනීමට, වමේ සිට දකුණට ඇස යොමු කෙරෙන ක්‍රියාකාරකම්වල නිරත කරවීමට මේ නිසා අවස්ථාව ලැබේ. මාංසපේශි සම්බන්ධ ක්‍රියාකාරකම් සමග ඇස හා අත සමායෝජනය කරමින් සියුම් ඉගෙනුම් අවස්ථා වෙත ශිෂ්‍යයා සූදානම් කරවීම මෙමගින් අපේක්ෂිත ය. පූර්ව කියවීම් හැකියා මතුවන සේ නිදහස් හැඩ ඇඳීමත්, එම හැඩ අනුසාරයෙන් ක්‍රමිකව පූර්ණ අක්ෂර ලිවීමේ හැකියාව ශිෂ්‍යයා තුළ ජනිත කරවීමත් ඔබ වෙත පැවරෙන භාරදූර වගකීමකි.

## මේ පෙළපොතෙහි යෙදෙන අකුරු පිළිබඳ විශ්ලේෂණය
(යෙදී ඇති අකුරු රතු පාටින් මුද්‍රණය කර ඇත.)

| | අ | ආ | ඇ | ඈ | ඉ | ඊ | උ | ඌ | එ | ඒ | ඔ | ඕ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක් | ක | කා | කැ | කෑ | කි | කී | කු | කූ | කෙ | කේ | කො | කෝ |
| ග් | ග | ගා | ගැ | ගෑ | ගි | ගී | ගු | ගූ | ගෙ | ගේ | ගො | ගෝ |
| ච් | ච | චා | චැ | චෑ | චි | චී | චු | චූ | චෙ | චේ | චො | චෝ |
| ජ් | ජ | ජා | ජැ | ජෑ | ජි | ජී | ජු | ජූ | ජෙ | ජේ | ජො | ජෝ |
| ට් | ට | ටා | ටැ | ටෑ | ටි | ටී | ටු | ටූ | ටෙ | ටේ | ටො | ටෝ |
| ඩ් | ඩ | ඩා | ඩැ | ඩෑ | ඩි | ඩී | ඩු | ඩූ | ඩෙ | ඩේ | ඩො | ඩෝ |
| ණ් | ණ | ණා | ණැ | ණෑ | ණි | ණී | ණු | ණූ | ණෙ | ණේ | ණො | ණෝ |
| ත් | ත | තා | තැ | තෑ | ති | තී | තු | තූ | තෙ | තේ | තො | තෝ |
| ද් | ද | දා | දැ | දෑ | දි | දී | දු | දූ | දෙ | දේ | දො | දෝ |
| න් | න | නා | නැ | නෑ | නි | නී | නු | නූ | නෙ | නේ | නො | නෝ |
| ප් | ප | පා | පැ | පෑ | පි | පී | පු | පූ | පෙ | පේ | පො | පෝ |
| බ් | බ | බා | බැ | බෑ | බි | බී | බු | බූ | බෙ | බේ | බො | බෝ |
| ම් | ම | මා | මැ | මෑ | මි | මී | මු | මූ | මෙ | මේ | මො | මෝ |
| ය් | ය | යා | යැ | යෑ | යි | යී | යු | යූ | යෙ | යේ | යො | යෝ |
| ර් | ර | රා | රැ | රෑ | රි | රී | රු | රූ | රෙ | රේ | රො | රෝ |
| ල් | ල | ලා | ලැ | ලෑ | ලි | ලී | ලු | ලූ | ලෙ | ලේ | ලො | ලෝ |
| ව් | ව | වා | වැ | වෑ | වි | වී | වු | වූ | වෙ | වේ | වො | වෝ |
| ස් | ස | සා | සැ | සෑ | සි | සී | සු | සූ | සෙ | සේ | සො | සෝ |
| හ් | හ | හා | හැ | හෑ | හි | හී | හු | හූ | හෙ | හේ | හො | හෝ |
| ළ් | ළ | ළා | ළැ | ළෑ | ළි | ළී | ළු | ළූ | ළෙ | ළේ | ළො | ළෝ |
| ශ් | ශ | ශා | ශැ | ශෑ | ශි | ශී | ශු | ශූ | ශෙ | ශේ | ශො | ශෝ |
| ඬ් | ඬ | ඬා | ඬැ | ඬෑ | ඬි | ඬී | ඬු | ඬූ | ඬෙ | ඬේ | ඬො | ඬෝ |
| ඳ් | ඳා | ඳා | ඳැ | ඳෑ | ඳි | ඳී | ඳු | ඳූ | ඳෙ | ඳේ | ඳො | ඳෝ |
| ඹ් | ඹ | ඹා | ඹැ | ඹෑ | ඹි | ඹී | ඹු | ඹූ | ඹෙ | ඹේ | ඹො | ඹෝ |

ං